# චුද්දසමො පාඨො

## කෙරාටිකො සිගාලො



අතීතෙ එකස්මිං වනසණ්ඩෙ සිගාලො විහාසි. සො එකදා **වනාසනෙන** වාපිං ගන්ත්වා තස්සා තටෙ **දුම්මනො** දුක්ඛිතො රුදමානො අට්ඨාසි. තදා තායං වෙලායං වාපියං වසන්තා කක්කටකා සිගාලං දිස්වා භීතා තීරං අසම්පත්තා ජලෙ එව විහරිංසු. **සිගාලො'පි** වනං අගන්ත්වා තස්මිං එව තටෙ විහාසි. **පුනදිවසෙ'පි** කක්කටකා සිගාලං **තත්ථෙව** නිසින්නං දිස්වා තස්ස සන්තිකං අගමිංසු. ගන්ත්වා සම්ම, සිගාල, ත්වං දුක්ඛිතො රුදමානො ඉමස්මිං තටෙ චිරායසි. කො හෙතු? මයං තං (කාරණං) ඤාතුං **ඉච්ඡාමා'ති** අවදිංසු. අථ සො සිගාලො **එවමභාසි.** "භොන්තො, මම ඤාතකා එතස්මිං වනෙ වසන්ති. එකදා තෙ සබ්බෙ මම සන්තිකං ආගම්ම ඉමායං වාපියං වසන්තෙ කක්කටකෙ ඛාදිතුං උපායං පුච්ඡිංසු. අහං තං කථං සුත්වා තුම්හාකං විනාසං අසහං 'එතං අපරාධං මා **කරොථා'ති** අවොචං. අථ සබ්බෙ තෙ මම ඤාතකා මං අක්කොසිත්වා පරිභාසිත්වා 'ත්වං න සිගාලජාතිකො, තස්මා කක්කටකානං **සන්තිකමෙව ගච්ඡාහී'ති** වත්වා තෙ සබ්බෙ මම ඤාතකා මං පහාය අගමිංසු. ඉදානි අහං **එකකො'ව** දුක්ඛිතො ඉමස්මිං තටෙ **විහරාමී"ති** ආහ. අථ කක්කටකා අයං සිගාලො සප්පුරිසො ගුණවා ච **භවතීති** තස්මිං විස්සාසං ආපජ්ජිංසු.

(පාලි රචනා 2)



නොමිලේ බෙදා හැරීම පිණිසයි

පදමාලාව

| | | |
|---|---|---|
| සිගාලො | - | හිවළා |
| එකස්මිං වනසණ්ඩෙ | - | එක් වනලැහැබක |
| තස්සා තටෙ | - | ඒ (වැව්) ඉවුරේ |
| දුක්ඛිතො | - | දුකට පත් ව |
| දුම්මනො | - | නො සතුටු ව |
| රුදමානො | - | අඬමින් |
| තායං වෙලායං | - | ඒ වේලාවෙහි |
| කක්කටකො | - | කකුළුවා |
| භීතා | - | බියපත් වූවාහු |
| තීරං | - | ඉවුරට |
| අසම්පත්ත | - | නොපැමිණි |
| විහාසි | - | වාසය කළේ ය |
| පුනදිවසෙ | - | ඊළඟ දිනයේ |
| තත්ථ එව | - | එහිම |
| අගන්ත්වා | - | නොගොස් |
| අගමිංසු | - | ගියහ |
| චිරායති | - | කල්යවයි |
| ඤාතුං | - | දැනගැනීමට |
| අවදිංසු | - | කීහ |
| අථ | - | ඉක්බිති |
| ඉමායං වාපියං | - | මේ වැවේ |
| අසහං | - | නො ඉවසනුයේ |
| අක්කොසිත්වා | - | බැණ |
| පරිභාසිත්වා | - | පරිභව කොට |
| පහාය | - | හැර |
| එකකො | - | හුදෙකලාව |

## අභ්‍යාස

| | | |
|---|---|---|
| කො - කවරෙක් | කීදිසාකාරෙන - කොයි ආකාරයෙන් | කත්ථ - කොහි |
| කුහිං - කොහි | කෙ - කවරහු | කිං - කුමක් |

1. 'කෙරාටිකො සිගාලො' ඡේදය සිංහලට නගන්න.
2. පහත දැක්වෙන ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

උදා: **සො එකදා කුහිං ගච්ඡි?**
**සො එකදා වාපිං ගච්ඡි.**

i. අතීතෙ එකස්මිං වනසණ්ඩෙ කො විහාසි?
ii. සො වාපියා තටෙ කීදිසාකාරෙන අවස්ථාසි?
iii. කක්කටකා කත්ථ විහරිංසු?
iv. සිගාලො වනං අගන්ත්වා කුහිං විහාසි?
v. පුනදිවසෙ කක්කටකා සිගාලස්ස කිං අවදි?

**සන්ධි හැඳින්වීම**

වෙන් ව ඇති පද දෙකක පූර්ව-පර වර්ණවල නිසියාකාර ගැළපීම සන්ධි නම් වේ. එයින් පූර්ව වර්ණය යනු පෙර පදයේ අග අකුරයි. පරවර්ණය යනු පසු පදයේ මුල් අකුරයි.

| | |
|---|---|
| **පූර්ව වර්ණය** | සන්ධි වන පද දෙකන් පෙර පදයේ අග අකුර පූර්වවර්ණයයි<br>වන + ආසනෙන<br>වන් + අ + ආසනෙන<br>ඉහත සන්ධි වන පද දෙකෙන් පෙරපදය **'වන'** යන්නයි. එහි අග අකුර යනු **'න'** යන්නට එක් ව ඇති **'අ'** යන ස්වරයයි. |
| **පර වර්ණය** | සන්ධි වන පද දෙකේ පසු පදයේ මුල් අකුර පරවර්ණයයි<br>වන + ආසනෙන<br>වන + ආ + සනෙන<br>ඉහත සන්ධි වන පද දෙකෙහි පසු පදය යනු **ආසනෙන** යන්නයි. එහි මුල් අකුර යනු පළමුව ඇති **ආ** යන්නයි. |

නිසියාකාර ගැළපීම සන්ධි විධි මගින් සිදු කරනු ලැබේ. එබඳු සන්ධි විධි නැතහොත් සන්ධි ක්‍රම කිහිපයක් පාලි ව්‍යාකරණයෙහි දැකිය හැකි ය. ඒවායින් කිහිපයක් මෙසේ ය.

i. ලෝපය — ii. ආදේශය
iii. ආගමය — iv. ද්විත්වය
v. දීර්ඝය — vi. හ්‍රස්වය

**සන්ධි ප්‍රයෝජන**

පද දෙකක් අතර ඇති පරතරය නැති වී සන්ධි පදයක් වූ පසු එම සන්ධි පදයෙන් භාෂාවට සැලසෙන ප්‍රයෝජන කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| කථනය | පහසුවෙන් උච්චාරණය කළ හැකි වීම | එතදවොච (එතං + අවොච) |
| ලේඛනය | අඩු අකුරු ප්‍රමාණයකින් ලිවිය හැකි වීම | ක්වචාසවණ්ණං (ක්වචි + අසවණ්ණං) |
| භාෂාව | ව්‍යක්ත වීම. | පුබ්බමධොධීතමස්සරං (පුබ්බං + අධොධීතං + අස්සරං) |
| ගාථාව | රිද්මය රැකගත හැකි වීම | වන්දෙහං (වන්දෙ + අහං) |

**සන්ධි ප්‍රභේද**

පාලි භාෂාවේ ප්‍රධාන වශයෙන් සන්ධි ප්‍රභේද තුනකි.

i. ස්වර සන්ධිය
ii. ව්‍යඤ්ජන සන්ධිය
iii. නිග්ගහීත සන්ධිය

**ස්වර සන්ධිය**

සන්ධි වන පද දෙකෙහි දක්නට ලැබෙන පූර්වවර්ණය හා පරවර්ණය යන දෙකම ස්වර වේ නම්, එම සන්ධිය ස්වර සන්ධි නම් වේ.

ලොක + අග්ගො - ලොකග්ගො
මාතු + උපට්ඨානං - මාතුපට්ඨානං
සබ්බ + එව - සබ්බෙව
තයො + අස්සු - තයස්සු
ධනම්මෙ + අත්ථි - ධනම්මත්ථි
ආකාසෙ + ඉව - ආකාසෙ'ව
ඡායා + ඉව - ඡායා'ව
වන්දෙ + අහං - වන්දෙ'හං
වසලො + ඉති - වසලො'ති
පාතො + එව - පාතො'ව
අනු + අද්ධමාසං - අන්වද්ධමාසං
චත්තාරො + ඉමෙ - චත්තාරො'මෙ
බන්ධුස්ස + ඉව - බන්ධුස්සෙව
චන්ද + උදයො - චන්දොදයො
බුද්ධ + අනුස්සති - බුද්ධානුස්සති
යානි + ඉධ - යානීධ
ගච්ඡාමි + ඉති - ගච්ඡාමීති
ඉදානි + අහං - ඉදානාහං
තථා + උපමං - තථූපමං
අප්පස්සුතො + අයං - අප්පස්සුතායං

**ව්‍යඤ්ජන සන්ධිය**

සන්ධි වන පද දෙකේ පූර්වවර්ණය ස්වරයක් වී පරවර්ණය ව්‍යඤ්ජනයක් වේ නම්, එම සන්ධිය ව්‍යඤ්ජන සන්ධි නම් වේ.

එසො + ධම්මො - එසධම්මො
සො + සීලවා - සසීලවා
අ + පමාදො - අප්පමාදො
අ + පතිවත්තියො - අප්පතිවත්තියො
අප්ප + සුතො - අප්පස්සුතො
අනු + සති - අනුස්සති
චතු + දිසං - චතුද්දිසං
නි + සාරො - නිස්සාරො

නි + ඝොසො - නිග්ඝොසො
දු + භික්ඛං - දුබ්භික්ඛං
මහා + භයං - මහබ්භයං
වත්ථු + තයං - වත්ථුත්තයං
තණ්හා + ඛයො - තණ්හක්ඛයො
අව + කාසො - ඔකාසො
අව + වදති - ඔවදති
දු + බලො - දුබ්බලො

**නිග්ගහීත සන්ධිය**

සන්ධි වන පද දෙකේ පූර්ව වර්ණය නිග්ගහීතයක් නම් එම සන්ධිය 'නිග්ගහීත සන්ධි' නම් වේ.

ධම්මං + චරෙ - ධම්මඤ්චරෙ
තං + ඨානං - තණ්ඨානං
තං + ධනං - තන්ධනං
තං + මිත්තං - තම්මිත්තං
සං + යොජනං - සඤ්ඤොජනං
තං + එව - තඤ්ඤෙව
කිං + එව - කිමෙව
එතං + අවොච - එතදවොච
ධනං + එව - ධනමෙව
යං + අනිච්චං - යදනිච්චං
විදූනං + අග්ගං - විදූනග්ගං
බුද්ධානං + සාසනං - බුද්ධානසාසනං
චිරං + පවාසිං - චිරප්පවාසිං
සං + රාගො - සාරාගො
හලං + ඉදානි - හලන්දානි
සදිසං + එව - සදිසංව

| සන්ධිය | හඳුනා ගන්නා ආකාරය | | උදාහරණය |
|---|---|---|---|
| ස්වරසන්ධි | සන්ධි වන පද දෙකේ | පූර්වවර්ණය හා පරවර්ණය ස්වර වේ. | තත්ථ + එව |
| ව්‍යඤ්ජනසන්ධි | | පූර්වවර්ණය ස්වරයක් වී පරවර්ණය ව්‍යඤ්ජනයක් වේ. | දු + මනො |
| නිග්ගහීතසන්ධි | | පූර්වවර්ණය නිග්ගහීතය වේ. | එවං + අභාසි |

## අභ්‍යාස

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. සන්ධිපදයක් යනු කුමක් ද?
ii. එකකො + එව යන විසන්ධිපදයේ පූර්වවර්ණය හා අපරවර්ණය පෙන්වා දෙන්න.
iii. ඔබ උගෙන ඇති සන්ධි විධි ලියා දක්වන්න.
iv. සන්ධිපදයක් සාදා ගන්නේ කෙසේ ද?
v. සන්ධිපදවලින් ලැබෙන ප්‍රයෝජන ලියා දක්වන්න.

3. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| විසන්ධිපදය | පූර්වවර්ණය | පරවර්ණය | සන්ධිපදය |
|---|---|---|---|
| ලොක + අග්ගො | ලොක් + අ | අ + ග්ගො | ලොකග්ගො |
| මාතු + උපට්ඨානං | | | මාතුපට්ඨානං |
| තණ්හා + ඛයො | | | තණ්හක්ඛයො |
| තං + ඨානං | | | තණ්ඨානං |
| චතු + දිසං | | | චතුද්දිසං |
| ආකාසෙ + ඉව | | | ආකාසෙ’ව |
| මහා + භයං | | | මහබ්භයං |

4. පහත දැක්වෙන සන්ධි පද යොදා වගුව සම්පූර්ණ කරන්න.

අතීව, යුජ්ඣිස්සාමාති, සන්තිකමෙව, කිමත්ථං, ගොලාකාරං, අප්පමාදො, සුරියාලොකං, පරිස්සාවෙත්වා, නිච්චමෙව, දුබ්බලො, සච්චන්ති, යුජ්ඣථා'ති, උග්ගණ්හිතුං, බරොදකං

| ස්වර සන්ධි | ව්‍යඤ්ජන සන්ධි | නිග්ගහීත සන්ධි |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

අප්පස්සුතායං පුරිසො බලිවද්දොව ජීරති.

ඇසූ පිරූ තැන් මඳ තැනැත්තා ගොනෙකු මෙන් වැඩේ.

(ධම්මපදපාළි, ජරාවග්ග, 7 ගාථාව)